බොරලැස්ගමුව නගර සභාව - 2022
---------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බොරලැස්ගමුව නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1(ආ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අතැති තොගය රු.7,836,728 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම වෙනස ඉවත් කිරීමට අදාළ ජර්නල් වවුචර් සකස් කර ඇති බව. | අතැති තොගය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂයන්ගේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ රු.14,363,746 ක හර ශේෂය හා හඳුනා නොගත් රු.224,217 ක හර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ නිවැරදි කරන බව. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට හා හඳුනා නොගත් හර ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ වැඩ නිම කරන ලද පිරිවැය රු.36,243,159 ක් වූ මාර්ග සඳහා රු.3,624,316 ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. | -එම- | ක්ෂය වීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | ප්‍රත්‍යාගණනය කරන ලද වසර තුළදී ක්ෂය කිරීම අවශ්‍ය නොවුවද ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් සඳහා ක්ෂය කිරීම නිසා ක්ෂය ගිණුම රු.3,511,567 කින් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | වර්ෂ තුළ ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් අයිතම් වලට අදාළව 2022 ජනවාරි 01 දිනට පැවති රු.18,906,466 ක ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙහි ශේෂය ඉවත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගිණුම් 2 කට අදාළ රු.4,544,247 ක ආරම්භක ශේෂයන් ලෙජරයට පිටපත් කර නොතිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශන තුලනය වූ ආකාරයද විගණනයට පැහැදිලි නොවිය. | 2021 වසරේ නොනිමි වැඩ ලෙස දක්වා ඇති රු.4,284,997 ක මුදල මෙම වසර වන විට සියළු වැඩ අවසන් ව පැවතීම හේතුවෙන් ණය හිමි ගෙවීම් යටතේ එකතු කර දක්වා ඇති බව. | ආරම්භක ශේෂ නිවැරදිව පිටපත් කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් කර නොතිබුණි. | විගණන ගාස්තු ඇස්තමේන්තුව ලැබුණු පසු 2023 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙන් කිරීම් කළ යුතුය. |
| (ඌ) | නාගරික සංවර්ධන අධිකාරී ගිණුමට අවස්ථා 04 ක දී යා යුතු රු.2,069,788 ක මුදල වැරදිමකින් පොදු ගිණුමට ඇතුළත් වී තිබුණි. | නිසි අවසරය ලබා ගැනීමෙන් පසු මෙම මුදල ස්ථිර තැම්පතු ගිණුමක ආයෝජනය කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (එ) | සභාවේ ක්ෂය ප්‍රතිපත්තිය වත්කම් ප්‍රයෝජ්‍ය ජීව කාලය පුරා හීන වන ශේෂ ක්‍රමයට බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය වූ රු.14,769,737 ක අගය සරල මාර්ග ක්‍රමයට ගණනය කර තිබුණි. | 2023 වර්ෂයේ නිවැරදි කරන බව. | ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය කළ යුතුය. |
| (ඒ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ආයෝජන පොලී ආදායම වූ රු.5,557,609 ක් අඩු කළ යුතු වුවත් එම අගය සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගැලපීමේදී එකතු කර තිබුණි. | එකඟ වන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙළ කළ යුතුය. |
| (ඔ) | වර්ෂයේ කාරක ප්‍රාග්ධනය වෙනස් වීම ගැලපීමේදී ලැබිය යුතු දෑ වල අඩු වීමේ අගය රු.8,180,037 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.38,826,705 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඕ) | වර්ෂයේ ගෙවිය යුතු දෑ වල වැඩි වීම රු.17,047,618 ක අගය රු.5,530,349 ක් ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කළ මුදල් ප්‍රවාහයට එකතු කිරීම නිසා මුදල් ප්‍රවාහය රු.11,517,269 ක් අඩුවෙන් පෙන්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ක) | සමාලෝචිත වර්ෂය තුළ දී ලද පොලී ආදායම රු.3,942,296 ක් වුවද එය මුදල් ප්‍රවාහයට රු.4,468,410 ක් ලෙස ගැලපීම් කර තිබුණි. | මෙම රු.526,114 ක මුදල 2021 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂයේ ලැබුණු මුදල් බව. | -එම- |
| (ග) | සමාලෝචිත වර්ෂය තුළ ලැබුණ ප්‍රාග්ධන වියදම් ප්‍රදානය රු.8,725,859 ක් වුවද එය රු.30,933,446 ක් ලෙස මුදල් ප්‍රවාහයට ගලපා තිබුණි. | එකඟ වන බව. | -එම- |
| (ජ) | වර්ෂයේ දිගු කාලීන ණය ගැනීම් ආපසු ගෙවීම් රු.1,866,000 ක අගය මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයේදී අඩු කළ යුතු වුවත් එම අගය එකතු කර තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් ඊට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.26,469,236 ක වෙනසක් නිරීක්ෂණය විය. | උපලේඛන සමග සැසඳීම් කරමින් පවතින අතර අවශ්‍ය සංශෝධන කර ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛනවල දැක්වෙන ශේෂ සමාන විය යුතුය. |
| (ආ) | වර්ෂයට අදාළ වරිපනම් බදු ආදායම රු.27,964,577 ක් විය යුතු වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වරිපනම් බදු ආදායම ලෙස රු.23,450,730 ක් දක්වා තිබුණි. ඒ අනුව රු.4,513,847 ක වෙනසක් විය. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයයන් 02 කට අදාළ රු.377,401 ක ශේෂයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | අදාළ ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.49,306,547 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.23,913,815 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය
#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු) 000‘ | (රු) 000‘ | (රු) 000‘ | (රු) 000‘ | (රු) 000‘ | (රු) 000‘ | (රු) 000‘ | (රු) 000‘ |
| වරිපනම් හා බදු | 27,300 | 27,664 | 32,023 | 23,911 | 27,000 | 27,383 | 25,151 | 28,269 |
| කුලී | 990 | 990 | 1,012 | 371 | 990 | 990 | 1,000 | 370 |
| බලපත්‍ර ගාස්තු | 750 | 238 | 238 | - | 700 | 225 | 225 | - |
| වෙනත් ආදායම් | 1,250 | 1,149 | 1,149 | - | 1,150 | 909 | 909 | 179 |
| එකතුව | 30,290 | 30,041 | 34,422 | 24,282 | 29,840 | 29,507 | 27,285 | 28,818 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | ඉකුත් වර්ෂය අවසානයට වරිපනම් ණයගැති ශේෂය රු.28,269,300 ක් වූ අතර ඉන් සමාලෝචිත වර්ෂය තුලදී රු.11,168,343 ක් අයකරගෙන තිබුණි. ඒ අනුව රු.17,100,957 හෙවත් සියයට හැට (60%) ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | 2022 වර්ෂය තුළ දේපළ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට, පෙර වර්ෂවල පැවති කොවිඩ් තත්ත්වය නිසා නොහැකි විය. මේ වන විට පවතින හිඟයෙන් 12% ක ප්‍රමාණයක් අය කර ගෙන ඇත. ඉතිරි හිඟය අය කර ගැනීම සඳහා නෛතික ක්‍රියා මාර්ග ගැනීමට නියමිත බව. | හිඟ අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක සීඩී.2/3/101 දරන චක්‍රලේඛය ප්‍රකාරව | 2023 මැයි 02 දින සිට නැවත දේපළ තක්සේරු කිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා කටයුතු සූදානම් කර ඇති | වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කර වරිපනම් බදු අයකළ |

| | | | |
|---|---|---|---|
| | දේපල වර්ෂ 5 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අය කළ යුතු වුවද සභාව විසින් 2009 වර්ෂයෙන් පසු දේපළ තක්සේරු කර නොතිබුණි. | බව. | යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.100,000 ට වැඩි දේපළ 05 කින් රු.1,125,199 ක් ද රු.50,000 ත් රු.100,000 ත් අතර දේපළ 05 කින් රු.1,080,727 ක් ද හිඟ හිටිව පැවතුණි. | මෙම පවත්නා හිඟ ස්ථානයන් අතරින් ඇතැම් ස්ථාන වසා දමා පවතින අතර මාර්ග කටයුතුවලදී ඉවත් වී ඇති දේපළය. අනෙකුත් පවත්නා දේපළවලින් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුලී | | |
| (i) | කඩකුලී ගිවිසුමෙහි කොන්දේසි 02 ප්‍රකාරව කුලිය ගෙවීම මසකට අධික කාලයක් ප්‍රමාද වුවහොත් අයිතිය අහිමි වන බව දක්වා තිබුණ ද 2022 දෙසැම්බර් 31 දිනට මාස 01 සිට 24 දක්වා කාලපරාසයක කඩ කාමර 19 ක හිඟ හිටි කඩ කුලී ආදායම රු.271,264 ක් විය. | පවරාගත හොත් නැවත බදු දීම සඳහා බදු කරුවන් සොයා ගැනීමට නොහැකි වීම නිසා මේ වන විට දී අංක 27 දරන කඩය බදු දීමට නොහැකි වී ඇත. බදු හිමියන් දැනුවත් කරමින් හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ගිවිසගත් දිනෙන් සෑම වසර තුනකට වරක් මාසික කුලිය ප්‍රතිශෝධනය විය යුතු වුවත් කඩකාමර 48 කින් ගිවිසුම් අලුත් කිරීමක් සිදු නොකර 2022 වර්ෂයේදීත් 2009 තක්සේරුව මත කඩකුලී අය කරමින් පැවතුණි. | 2023 මැයි මස සිට තක්සේරු කටයුතු කිරීමට නියමිතව ඇති බැවින් ඉන්පසු අය කිරීම් සිදු කරන බව. | වසර 03 කට වරක් දේපල තක්සේරු කර කුලිය සංශෝධනය කළ යුතුය. |
| (ඇ) | වෙළඳ බලපත්‍ර ගාස්තු | | |
| | 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බලපත්‍ර ආදායම රු.750,000 ක් වන අතර රැස් කළ ආදායම රු.237,531 ක් විය. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 31 ක් පමණක් විය. | 2023 වර්ෂයේ ආර්.ඕ.නිලධාරීන් මඟින් සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර, ඒ අනුව 2023 වර්ෂයේ ආදායම ඉහළ දැමීමට කටයුතු කරන බව. | වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරන කසළ විකිණීම සඳහා හෝ කොම්පොස්ට් ව්‍යාපෘතියක් මඟින් පොහොර නිෂ්පාදනය කිරීමට හා නොදිරන කසළ විකිණීම සඳහා කටයුතු කිරීම තුළින් කසළ බැහැර කිරීම සඳහා දරන වියදම් අවම කර ගත හැකිව පැවතිණි. | කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සුදුසු ඉඩමක් සොයා ගැනීමට කිහිපවරක් උත්සාහ කළ ද, අධික ජනගහනයක් වෙසෙන මෙම ප්‍රදේශයේ එවැනි ඉඩමක් සොයා ගැනීමට නොහැකි වී ඇති අතර ඉදිරියේ දී එවැනි ඉඩමක් ලබා ගැනීමට ස්ථාවර වත්කම් කමිටුවේ දී තීරණය කරන බව. | කසළ වියදම් අවම කර ගනිමින් කසල තුලින් ආදායමක් ඉපයීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 02 ක් සඳහා රු.42,172 ක් කැස්බෑව ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලයෙන් ද ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 26 ක් සඳහා රු.10,701,222 ක් ග්‍රාමීය මාර්ග අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යංශයෙන්ද වශයෙන් එකතුව රු.10,743,394 ක් සභාව විසින් අයකරගෙන අදාළ ආයතන වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල මේ වන විටත් ප්‍රතිපූර්ණය කර නොමැති අතර ප්‍රතිපූර්ණය කිරීමෙන් පසු ගෙවීම් කටයුතු කිරීමට නියමිතව ඇති බව. | මුදල් ප්‍රතිපූර්ණය කරගෙන අදාළ ආයතන වෙත ගෙවිය යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය අනුව පැවති දේපළ 29 න් 20 කට අයිතිය තහවුරු කිරිමට අදාළ ඔප්පු හෝ පැවැරුම් නියෝග නොතිබුණි. | දැනට ඔප්පු මඟින් අයිතිය තහවුරු කර ඇති ඉඩම් හැර අනෙකුත් දේපළ වල අයිතිය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |